නුවරඑළිය මහා නගර සභාව - 2024
---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

නුවරඑළිය මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ස්ථාවර තැන්පතු දෙකක සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.8,213,313 ක ලැබිය යුතු පොළී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.	2025 අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු එකතුව රු. 9,763,951 ක ස්ථාවර තැන්පත් පොළී නිවැරදිව ආයෝජන ගිණුම හර කර තිබුණ ද, ලැබිය යුතු ආයෝජන පොළී ගිණුමට රු. 14,743,133 ක් ලෙස රු. 4,979,182 ක් වැඩිපුර බැර කර තිබුණි.	2025 අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂයන් තුල හා සමාලෝචිත වර්ෂය තුල බැංකුවට ඍජුව බැර කර තිබුණු එකතුව රු. 3,208,898 ක ස්විප් ගිණුමේ පොළී ආදායම සමාලෝචිත වර්ෂයේ දී මුදල් පොතට හර කර තිබුණ ද සමුච්චිත අරමුදලට හා වර්ෂයේ ආදායමට බැර කර නොතිබුණි.	2025 අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.264,321 ක අගරු චෙක්පත් 02 ක් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම සැකසීමේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයට අදාළ අගරු චෙක්පත් 31 ක් සඳහා වූ රු.169,614 ක සියයට 10 ක් වූ දඩ ගාස්තුව ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම සැකසීමේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්ථා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ශේෂ 05 ක ශේෂයන්, උපලේඛනල දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 3,933,871 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.	2025 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ගිණුම් ශේෂ සමඟ උපලේඛනවල දැක්වෙන ශේෂ සැසදිය යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**පාර්ලිමේන්තු පනත්**			
(i)	**මහා නගර සභා ආඥා පනත.(252 අධිකාරය)**			
	247 (අ) සිට (ඇ) වගන්ති	සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙළඳ ආයතන 125 කට එකතුව රු 851,200 ක් වූ වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණි.	හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව.	නියමිත කාළය තුළ වෙළෙඳ බලපත්‍ර නිකුත් කළ යුතුය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**			
i.	මු. රෙ 571 (3)	2009-2022 කාලයට අදාළ එකතුව රු. 18,733,995 ක කාලය ඉකුත් වු තැන්පත් 525 ක් නිරවුල් කර නොතිබුණි.	ඉදිරියේ දී ආදායමට ගැනීමට කටයුතු කරන බව.	කල් ඉකුත් වූ තැන්පත් නිරවුල් කළ යුතුය.
ii.	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධනය කරන ලද මු.රෙ 371 (2) (ආ) සහ 05 වගන්ති	අග්‍රිම ලබාගත් කාර්යය අවසන් වී දින 10 ක් ඇතුළත හෝ අවසන් වු වහාම නැවත පියවිය යුතු වුවද, අවුරුදු 5 සිට අවුරුදු 08 ක කාල පරාසයන් තුල නිලධාරින් 06 දෙනෙකු ලබා ගෙන තිබුණු අත්තිකාරම් එකතුව රු.1,239,500 ක් පියවා නොතිබුණි.	මූලික විමර්ෂන කටයුතු සිදුකර එම වාර්තා මු.රෙ. 104 (3) පරීක්ෂණය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව.	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අත්තිකාරම් පියවා ගත යුතුය.

(ඇ) වෙනත් චක්‍රලේඛ

2021 දෙසැම්බර් 24 දිනැති අංක DMA/AMC/02/2021/02 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය	මහා නගර සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2023 හා 2024 වර්ෂ සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි.	කරුණු සොයා බලා නිවැරදි කරන බව.	අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.139,945,011 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 231,769,227 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කළ බැංකු ගිණුම් 03 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් එකතුව රු. 5,234,580ක හඳුනා නොගත් ගෙවීම්, හඳුනා නොගත් ලැබීම්, හා උපලබ්ධි නොවූ චෙක්පත් 29 ක් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.	නිරවුල් කිරීමට කටයුතු කරන බව.	හඳුනා නොගත් ශේෂයන් හඳුනාගෙන නිවැරදි කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	141,090,200	144,303,199	128,387,128	147,190,813	140,549,100	122,819,119	110,778,126	137,974,418
(ii)	කඩ කුලී	94,176,900	59,968,388	54,088,234	71,091,703	111,932,700	63,991,762	53,240,344	70,378,359
(iii)	බලපත්‍ර ගාස්තු	23,901,500	23,733,248	14,698,788	41,532,447	22,252,000	26,908,286	25,343,036	34,341,807
(iv)	වෙනත් ආදායම්	272,454,048	492,990,679	498,485,834	116,873,476	439,352,100	105,425,835	38,853,911	108,658,328
		531,622,648	720,995,514	695,659,984	376,688,439	714,085,900	319,145,002	228,215,417	351,352,912

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් බදු**		
	සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු 87,438,688 ක වරිපනම් හිඟයක් පැවතුණි. ඉන් එක් ඒකකයක හිඟය රු.100,000 ඉක්ම වූ ඒකක 81 කින් රු18,653,230 ක්, හා ඒකකයක හිඟය රු 50,000 ත් රු 100,000 අතර ඒකක 160 කින් අයවිය යුතු රු.10,999,610 ක්, මහා නගර සභා ආඥා පනතේ 247 (අ) (ඇ) විධිවිධාන අනුගමනය අය කර නොතිබුණි.	2025 වර්ෂයේ දේපල තහනම් කිරීමට හා හිඟ අය කිරීමට වැඩපිළිවෙලක් සකස් කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(ආ)	**කුලී**		
i.	සමාලෝචිත වර්ෂය අවසාන දිනට කඩ කාමර 433 කින් එකතුව රු.49,254,797 ක කඩ කුලී හිඟයක් පැවතුණි.ඉන් එක් කඩ කාමරයක කුලී හිඟය රු.100,000 ඉක්ම වූ කඩ කාමර 107 ක එකතුව රු.43,169,691 ක හා එක් කඩ කාමරයක හිඟය රු.50,000 ත් රු.100,000 ත් අතර වූ කඩ කාමර 32 ක එකතුව රු.2,238,136 ක හිඟ ශේෂයන් විය.	කඩ මුද්‍රා තැබීම් හා හිඟ අය කිරීම සිදු කරන අතර, ව්‍යාජ බිල් කිරීම් කපා හැරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
ii.	සමාලෝචිත වර්ෂය අවසාන දිනට ග්‍රෙගරි වැවේ කඩ කාමර 41 කින් අයවිය යුතු කුලී එකතුව රු.3,772,934 ක හිඟයක් පැවතුණි. ඉන් එක් කඩ කාමරයක හිඟය රු.100,000 ඉක්මවූ කඩ 10 ක එකතුව රු.2,918,596 ක හිඟයක් ද විය.	කඩ මුද්‍රා තැබීම් හා හිඟ අය කිරීම සිදු කරන බව හා රු.1,718,365 ක වටිනාකමක් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පැවති රු.861,800 ක වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායමෙන් රු.757,000 ක් වූ සියයට 87 ක් හා වර්ෂයේ බිල්කළ ආදායමෙන් රු.680,000 ක් මහා නගර සභා ආඥා පනතේ 247 (අ) (ඇ) විධිවිධාන අනුගමනය කර ගාස්තු අය කර නොතිබුණි.	වසා තිබූ ව්‍යාපාර වෙනුවෙන් බිල්කරන ලද වටිනාකම් ඉවත් කිරීමට හා , ගෙවීම් නොකරන ලද ස්ථාන සඳහා නඩු පැවරීමටත් කටයුතු කරන බව.	අදාළ වර්ෂය තුළ දී බලපත්‍ර ගාස්තු අය කළ යුතුය.
(ඈ)	**උසාවි දඩ හා මුද්දර ගාස්තු**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 411,664 ක් හා මුද්දර ගාස්තු රු.78,180,828 ක් විය.	විගණන නිරීක්ෂණ සමග එකඟ වන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය.

(ඉ) වෙනත් ආදායම්

i.	සමාලෝචිත වර්ෂය අවසාන දිනට ජල පාරිභෝගිකයන් 5598 කින් රු.37,784,304 ක ජල ගාස්තු හිඟයක් පැවතුණි. ඉන් එක් පාරිභෝගිකයකුගේ හිඟය රු.100,000 ඉක්ම වූ පාරිභෝගිකයන් 48 කින් අයවිය යුතු රු.11,781,696 ක හිඟ ශේෂයක් විය.	මාස තුනකට වැඩි හිඟ පවතින පාරිභෝගිගයින් සඳහා රතු නිවේදන යොමු කිරීම හා විසන්ධි කිරීම මඟින් අය කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
ii.	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පැවති රු. 4,638,033 ක හිඟ දැන්වීම් පුවරු ආදායමෙන් කිසිදු මුදලක් අය කර නොතිබුණු අතර වර්ෂයේ බිල්කළ ආදායමෙන් රු.2,246,143 ක්ද, මහා නගර සභා ආඥා පනතේ 254 (අ) (1) ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි.	සිහි කැඳවීම් සිදු කර ඇති බවත් ගාස්තු නොගෙවන පුවරු ඉවත් කිරීමට නීතිමය කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
iii.	සමාලෝචිත වර්ෂය අවසාන දිනට ග්‍රෙගරි වැවේ බෝට්ටු 23 කින් එකතුව රු.6,607,712 ක බෝට්ටු කුලී ආදායම් හිඟ ශේෂයක් පැවති අතර එහි එක් බෝට්ටු කරුවෙකුගේ හිඟය රු.500,000 ඉක්ම වූ බෝට්ටුකරුවන් 04 දෙනෙකුගේ එකතුව රු.5,218,799 ක් හා එක් බෝට්ටුකරුවෙකුගේ හිඟය රු.100,000 ත් රු.500,000 ත් අතර වූ බෝට්ටුකරුවන් 05 කුගේ එකතුව රු.1,033,882 ක හිඟ ශේෂයක් විය.	හිඟ බෝට්ටු ගාස්තු සතිපතා අය කර ගැනීමට අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 නොවැම්බර් 19 දින පැවති මුදල් හා නීති පිළිබඳ ස්ථාවර කාරක සභා වාර්තාව අනුව වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන ග්‍රෙගරි වැව බෝට්ටු සේවාව විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර 2022 නොවැම්බර් 03 දින පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් සම්මත කර ගෙන නොතිබුණි.	මෙම අතුරු ව්‍යවස්ථා අනුමත කර දෙන මෙන් පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති නමුත් ප්‍රමාදයක් පවතින බව.	පසු විපරම් කර අදාල අතුරු ව්‍යවස්ථාව පනවා ගත යුතුය.
(ආ)	මහා නගර සභා ආඥා පනතේ 247 (අ) (ඇ) අනුව ආදායම් උත්පාදන කටයුතු සිදුකරන කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක පෝනීන් ධාවනය නියාමනය කිරීම	අතුරු ව්‍යවස්ථාවක් පැනවීමේ කටයුතු ඉදිරියේදී සිදු කරන බව.	පෝනීන් ධාවනය නියාමනය කිරීම සඳහා අතුරු

	සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.		ව්‍යවස්ථා පනවා ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වික්ටෝරියා උද්‍යානයේ හෙළ බොජුන්හලක් පවත්වාගෙන යාම සඳහා 2016 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත රු.430,000 ක වාර්ෂික බදු කුලියට ලබා දී තිබුණද 2016 සිට 2022 දක්වා වු කාල පරාසය සඳහා රු. 2,257,500 ක හිඟ බිම් කුලිය අයකර නොතිබුණි.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දැනට මෙම හෙළ බොජුන් හළ මහා නගර සභාවට තක්සේරු කර පැවරීමට එකග වී ඇති අතර ඒ සඳහා ගෙවිය යුතු මුදලින් ලැබිය යුතු කුලිය හිලව් කර ගන්නා බව.	කුලී ආදායම් අය කළ යුතුය.
(ආ)	සභාව සතු වික්ටෝරියා උද්‍යානයේ පිහිටි ආපන ශාලාව ටෙන්ඩර් මගින් බදු දීමට කටයුතු කර තිබුණද, ගිවිසුම නිසි පරිදි සකස් නොකිරිම හා බදුකරුට මූලික කටයුතු ඉටු කර නොදීම හේතුවෙන් ව්‍යාපාර නිසිලෙස ඉටු කිරීමට නොහැකි වීම මත 2011 -2021 කාලය සඳහා රු.2,360,697 ක බදු කුලි හා 2023 ජනවාරි 01 සිට 2024 ජූලි 31 දක්වා ලැබිය යුතු මුළු ටෙන්ඩර් ආදායම රු. 4,083,800 ක්ද, මහා නගර සභාවට අහිමි වී තිබුණි. එමෙන්ම 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 කාලය සඳහා ටෙන්ඩර් බදු ලබා ගත් පාර්ශවය මාස දෙකක් පමණක් වෙළඳාම සිදු කර 2023 මැයි වෙළඳ කටයුතු කිරීමෙන් ඉවත් වී ඇතත් වාර්ෂික ටෙන්ඩර් මුදලින් එතෙක් ගෙවා තිබුණු රු. 1,323,000 ක වාරික මුදලින් සභාවට සිදු වි ඇති අලාභ අයකර ඉතිරි මුදල් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.	2011 සිට 2021 දක්වා සහ 2023 අගෝස්තු 01 දින සිට 2024 ජූලි 31 දක්වා හිඟ ටෙන්ඩර් වාරික මුදල් අයකර ගැනීමට නඩු පවරා ඇති අතර වැඩිපුර අයකර ඇති මුදල ටෙන්ඩර්කරු වෙත නිදහස් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	හිඟ බදු අය කර ගැනිමට හා වැඩිපුර ලබා ගෙන ඇති මුදල් නිරවුල් කළ යුතුය.
(ඇ)	මහා නගර සභා බල ප්‍රදේශය් හැඩන්හිල් මාවතේ පිහිටි කාමර 29 කින් යුතු සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයක 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා නිවැරදිව වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අය නොකර වාර්ෂිකව රු. 3,315 ක බදු මුදලක් පමණක් අයකර තිබුණි. මේ පිළිබඳ නැවත විමසුමක් නිකුත් කිරීමෙන් පසු දේපල තාවකාලික තක්සේරු කර 2019 සිට 2020 දක්වා හිඟ වාර්ෂික බදු මුදලද සමඟ අයකළ යුතු වරිපනම් බදු ප්‍රමාණය රු.786,830 ක් ලෙස හඳුනා ගෙන තිබුණද, එම මුදල් අය කර නොතිබුණි.	දේපළ තාවකාලිකව තක්සේරු අනුව වරිපනම් බදු අය කිරිමට ඉදිරි කටයුතු කරන බව.	දේපළේ නව තාවකාලික තක්සේරුව අනුව වරිපනම් අය කළ යුතුය.

(ඇ)	මහා නගර සභා බල ප්‍රදේශයේ ග්ලෙන්ෆෝල් ප්‍රදේශයේ පිහිටි වර්ග අඩි 44625 කින් සමන්විත විශාල වාණිජ දේපලක් සඳහා 2019 සිට නිවැරදිව වාර්ෂික වටිනාකම තක්සේරු නොකර වාර්ෂිකව රු.4,000 ක් පමණක් වරිපනම් බදු අයකර තිබීමෙන් විශාල ආදායමක් සභාවට අහිමි වී තිබුණි.	අයිතිකරු සඳහා මෙම ස්ථානයේ පවතින ප්‍රධාන දේපළට මෙම දේපලද ඒකාබද්ධ කර වරිපනම් අය කරන අතර ඉදිරියේ දී 2019 සිට හිඟ බදු ගනනය කර අය කරන බව.	දේපළ නිවැරදිව තක්සේරු කර වරිපනම් බදු අය කළ යුතුය.
(ඉ)	මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි කාමර 32 කින් සමන්විත වර්ග අඩි 16000 ක හෝටලය සඳහා අනුකූලතා සහතික නිකුත් කර ඇතත් නිවැරදිව තක්සේරු කර වරිපනම් බදු අය කර නොතිබුණි.	අදාළ ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය නිකුත් කර ඇති දින සිට නව තක්සේරුව ක්‍රියාත්මක කළ කාල පරාසය වෙනුවෙන් අය විය යුතු හිඟ වරිපනම් බදු අය කරන බව.	දේපල නිවැරදිව තක්සේරු කර වරිපනම් බදු අය කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු පොදු සැපයුම් ණයහිමි ශේෂය රු.8,890,404 ක් විය. ඉන් වසර 05 කට වැඩි රු.346,585 ක් හා වසර 2 – 4 ත් අතර රු.1,324,905 ක නිරවුල් නොකළ ශේෂයක්ද විය.	අදාළ ආයතන වෙත දැනුම් දුන්න ද පැරණි ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී නොමැති බව.	ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.86,576,919 ක ණයගැති ශේෂයක් විය. ඉන් වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.25,541,259 ක්, වසර 3 ත් 5ත් අතර කාල පරාසයක පවතින එකතුව රු.23,202,801 ක් හා වසර 1 ත් 3ත් අතර කාල පරාසයක පවතින එකතුව රු.11,701,993 ක ශේෂයක්ද විය.	කරුණු පරීක්ෂා කර වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කරන කරන බව.	ලැබිය යුතු මුදල් අය කර ගත යුතුය.

3.3 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු 2,157,500 ක වාහන 05 ක් වසර 03 ත් 15 ත් අතර කාලයක සිටද, වටිනාකම හදුනාගත	අදාළ වත්කම් අපහරණය කිරීම සඳහා තක්සේරුවක් ලබා	අලුත්වැඩියාකර භාවිතා කිරීමට හෝ අපහරණ කිරීමට

නොහැකි වාහන 07 ක් වසර 02 ත් 17 ත් අතර කාලයක සිටද භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.	ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පවරා නොගත් වත්කම්		
සභාව පරිහරණය කරන ගොඩනැගිලි සහිත ඉඩම් කොටස් 11 ක අයිතිය පවරා ගෙන නොතිබුණි.	ප්‍රාදේශිය ලේකම් හා ඉඩම් කොමසාරිස් වෙතින් පවරා ගැනීම් සඳහා උපදෙස් ඉල්ලා ඇති බව.	සභාව සතු දේපළ වල අයිතිය පවරාගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය තත්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී පුරප්පාඩු 97 ක් පවැතුණි. ඉන් ඉංජිනේරු, ආදායම් පරීක්ෂක ,මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් හා කළමනාකරණ සේවා තනතුරුවල එකතුව 14 ක් වූ පුරප්පාඩුව පැවතීම ආයතනයේ කටයුතු විධිමත්ව ඉටු කිරීමට දැඩි බාධාවක්ව පැවතුණි.	වර්තමානය වන විට පුරප්පාඩු 97 ක් දක්වා අඩු වී ඇති බව හා අනෙකුත් පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට මියගිය ,විශ්‍රාම ගිය, සේවයෙන් ඉවත් කළ හා ස්ථාන මාරුවී ගිය සේවකයින් 75 දෙනෙකුගේ එකතුව රු.4,324,533 ක සේවක ණය අය කර නොතිබුණි.	ස්ථාන මාරු ලැබ ගිය නිලධාරින්ගේ සේවක ණය ජ'නල් මගින් හා මාසික අවකරණ මගින් අය කර ගනිමින් පවතින බව.	හිඟ සේවක ණය කඩිනමින් අය කළ යුතුය.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මහා නගර සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන අභ්‍යන්තර විගණක හා සහායක නිළධාරීන් දෙදෙනෙකු යටතේ ස්ථාපිත කර තිබුණද ඉකුත් වර්ෂය හා සමාලෝචිත තුළ අභ්‍යන්තර විගණන වාර්තා 04 ක් පමණක් නිකුත් කර තිබුණු බැවින් කාර්ය සාධනය අවම මට්ටමක පැවතුණි.	මු.රෙ.104 (03) පරීක්ෂණ 30 කට ආසන්න ප්‍රමාණයක් සිදු කිරීම නිසා විගණන කටයුතු ප්‍රමාද වූ අතර ඉදිරියේ දී විගණන කටයුතු නිවැරදිව කරන බව.	අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණනය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය.